---

මන්මුනෙයි පත්තු ප්‍රාදේශිය සභාව

මඩකලපුව දිස්ත්‍රික්කය .

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 20 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 08 දින ඉදිරිපත් කරන ලදී . සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 මැයි 08 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 . මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි පත්තු ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනයන් හි ප්‍රතිපාදන සලසා නොතිබුණි .

(ආ) සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු භාණ්ඩ වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන් හි ඇතුලත් කර නොතිබුණි .

(ඇ) ඉඩම් ලියාපදිංචි කිරිම වෙනුවෙන් ලැබිය යුතු රු.3,337,870 ක් මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රතිසම්පාදන සංචිතයක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,462,933 ක් වූ අතර , ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා පනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,012,502 ක විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම . |
|---|---|---|---|
| | රු " 000 | රු " 000 | රු " 000 |
| (i) වරිපනම් සහ බදු | 760 | 632 | 128 |
| (ii) කල්බදු කුලී | 3,219 | 292 | 294 |
| (iii) බලපත්‍ර ගාස්තු | 560 | 547 | 12 |
| (iv) වෙනත් ආදායම් | 1,150 | 1,044 | 105 |

---

2.2.2 උසාවි දඩ

------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් බලධාරීන් ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ප්‍රමාණය රු.1,653,166ක් විය.

2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

2007 සිට 2011 වර්ෂය දක්වා ගෙවන ලද එකතුව රු.457,061 ක් වූ අත්තිකාරම් අයකරගෙන නොතිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමණාකරණය

(ඈ) අයවැය පාලනය

s/s .